*සැ. යු.*– 2006.07.14 දින පළවූ අංක 1,454 දරන *ගැසට් පත්‍රයේ* IVඅ කොටස පළ නොකරන ලදී.
පොත් නාමාවලියේ ඔක්තෝබර්, දෙසැම්බර් කාර්තුව 1999 ඉංග්‍රීසි භාෂාවෙන් මෙවර *ගැසට් පත්‍රයේ* **V** කොටසේ පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,455 — 2006 ජූලි 21 වැනි සිකුරාදා — 2006.07.21**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු … … … … | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … | 871 |

*සැ. යු.*– උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන ) පනත් කෙටුම්පත 2006 ජූනි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

*සැ. යු.*– මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන ) පනත් කෙටුම්පත 2006 ජූනි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

*සැ. යු.*– සුදු (විශේෂ විධිවිධාන ) පනත් කෙටුම්පත 2006 ජූනි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවත් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ජූලි මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 ජූලි මස 14 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් වි භාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට වි භාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවි ය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# විභාග සහ විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

### උසස් තාක්ෂණ ආයතනය - කොළඹ 15

*උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාවට සිසුන් ඇතුළත් කිරීම 2006/2007 අධ්‍යයන වර්ෂය*

යථෝක්ත පාඨමාලාව සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන පූර්ණකාලීන තුන් අවුරුදු න්‍යායික හා හය මාසික වැඩබිම් පුහුණුව ඇතුළත් පාඨමාලාවක් වන අතර සිවිල්, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු යන විශේෂිත ඉංජිනේරු ක්ෂේත්‍රයන්ගෙන් සමන්විත වේ. මෙම පාඨමාලාව හදාරා ලන්ඩන් ඉංජිනේරු මණ්ඩලය මගින් තීරණය කරනු ලබන කුසලතා සාමාර්ථ සංඛ්‍යාවක් ලබා ගැනීම CEI (ලන්ඩන්) විභාගයේ පළමු අදියරෙන් නිදහස් වීම සඳහා සුදුසුකමක් වනු ඇත.

පාඨමාලාව සඳහා බඳවා ගැනීමට සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :

01. අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම.

02. (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් විසින් 2005 වර්ෂයේ හෝ ඊට පෙර පවත්වන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ (පැරණි නිර්දේශය) විභාගයේදී පහත සඳහන් විෂයයන් හතරෙන් එකවර සමත් වී තිබීම :

- (i) ව්‍යවහාරික ගණිතය,
- (ii) ශුද්ධ ගණිතය,
- (iii) භෞතික විද්‍යාව,
- (iv) රසායන විද්‍යාව.

(ආ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් විසින් 2005 වර්ෂයේ හෝ ඊට පෙර පවත්වන ලද නව නිර්දේශයෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය හදාරන ලද අයදුම්කරුවන් අවම වශයෙන් සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් තුනෙන් එකවර සමත්ව තිබිය යුතුය.

03. අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 23 ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

අයදුම්කරුවන් සතියේ දිනයන්හි පාඨමාලාවන් සඳහා සහභාගී වීමට නිදහස් විය යුතු අතර සති අන්තයේදී ද අවශ්‍යතා අනුව පාඨමාලා කටයුතුවලට සහභාගී වීමට හැකි විය යුතුය.

අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කර ගත යුතුය.

ඒ ඒ පාඨමාලාවන්ට තෝරා ගැනීමේදී අ.පො.ස. (උ.පෙළ) ලකුණුවල සාමාන්‍ය හෝ Z-score සැළකිල්ලට ගනු ලැබේ.

අයදුම්පත්‍ර ගාස්තුව රු. 250.00 කි. එම ගාස්තු මුදල මහජන බැංකුව, උද්‍යාන වීදිය ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් 0025-1010129111 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ජංගම ගිණුමට බැරකර ලබා ගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතට ඇමිණිය යුතුය.

නියමිත අයුරින් සකස්කළ අයදුම්පත්‍ර අධ්‍යක්ෂිකා, උසස් තාක්ෂණ ආයතනය, අංක 42, රොද්‍රිගු පෙදෙස, කොළඹ 15, යන ලිපිනයට 2006.08.11 දිනට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. "උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම් පත්‍රය 2006/2007" යන්න ලියුම් කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි සටහන් කළ යුතුය. උක්ත අංක දරන ගිණුමට හැර වෙනත් ගිණුම්වලට බැරකරන ලද කුවිතාන්සි සහිත අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක, අනුබද්ධිත විශ්ව විද්‍යාල ආයතනයක, කාර්මික විද්‍යාලයක, අධ්‍යාපන විද්‍යා පීඨයක/ගුරු පුහුණු ආයතනයක හෝ වෙනත් උසස් තාක්ෂණ ආයතනයක අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් පාඨමාලාවක් හැදෑරීම සඳහා ලියාපදිංචි වී ඇති සිසුන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ පූර්ණකාලීන පාඨමාලාවක් හැදෑරීම සඳහා බඳවා ගැනීමට සුදුසුකම් නොලබයි. කිසියම් ශිෂ්‍යයෙකු එකම කාලය තුළදී වෙනත් ඉහත දැක්වූ රාජ්‍ය ආයතනයක පූර්ණකාලීන ශිෂ්‍යයෙකු ලෙස පාඨමාලාවක් හදාරන බව හෙළිදරවු වුවහොත් ඇයගේ/ඔහුගේ ලියාපදිංචිය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් අවලංගු කරන බව ද සැළකිය යුතුය.

මට්ටක්කුලිය උසස් තාක්ෂණ ආයතනයේ ඉංජිනේරු අංශයට 2006/2007 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන බව කරුණාවෙන් සලකන්න.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය,
අංක 18/2, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

*ආදර්ශ අයදුම් පත්‍රය*

**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය**

***උසස් තාක්ෂණ ආයතනය - කොළඹ 15 2006/2007 අධ්‍යයන වර්ෂය***

***උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ.ජා.ඉ.ඩි) පාඨමාලාව සඳහා අයදුම්පත්‍රය***

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :

02. මුලකුරුවලින් කියවෙන නම :

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. උපන් දිනය :

05. ස්ත්‍රී/පුරුෂ භාවය :

06. ස්ථිර ලිපිනය : (පහත කොටුවෙහි ලියන්න)

07. පරිපාලන දිස්ත්‍රික්කය :

08. වඩාත් කැමති ඉංජිනේරු ක්ෂේත්‍රයන් පිළිවෙලින් :

| | |
|---|---|
| පළමු තේරීම | |
| දෙවැනි තේරීම | |
| තෙවන තේරීම | |

09. ඉංග්‍රීසි විෂය පිළිබඳ අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් ලත් ප්‍රතිඵල :————.

| වර්ෂය | විභාගය | විභාග අංකය | ලබාගත් සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

10. ඔබගේ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ හොඳම ප්‍රතිඵල (2005 වසර හෝ ඊට පෙර) :

| වර්ෂය | පාඨමාලාව | | විභාග අංකය | මාධ්‍යය |
|---|---|---|---|---|
| | පැරණි | නව | | |

*පැරණි නිර්දේශය*

| *විෂයයන්* | | *ශ්‍රේණිය* |
|---|---|---|
| 1. | ව්‍යාවහාරික ගණිතය | |
| 2. | ශුද්ධ ගණිතය | |
| 3. | රසායන විද්‍යාව | |
| 4. | භෞතික විද්‍යාව | |
| | මුළු ලකුණු එකතුව/Z-score | |

*නව නිර්දේශය*

| *විෂයයන්* | | *ශ්‍රේණිය* |
|---|---|---|
| 1. | සංයුක්ත ගණිතය | |
| 2. | භෞතික විද්‍යාව | |
| 3. | රසායන විද්‍යාව | |
| 4. | සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| | මුළු ලකුණු එකතුව/Z-score | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අවස්ථාව | පළමුවන | | දෙවන | | තුන්වන | |

මම වෙනත් රාජ්‍ය ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් හදාරන්නේ නැති බව මෙයින් ප්‍රකාශ කර සිටිමි. වෙනත් රාජ්‍ය ආයතනයක එකම කාලය තුළදී වෙනත් පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරන බව හෙළිදරව් වුවහොත් මාගේ ලියාපදිංචිය අවලංගු වන බව දනිමි. මෙහි සඳහන් තොරතුරු මාගේ දැනීම අනුව සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————.

(රු.250 මුදල් ගෙවූ බවට බැංකු කුවිතාන්සිය අමුණන්න)

07-306

---

## සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ප්‍රාථමික ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2006

1.0 සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ප්‍රාථමික ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතා මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් දිස්ත්‍රික් ජනගහණ අනුපාත පදනමින් සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ප්‍රාථමික සේවයේ තනතුර සඳහා පත් කිරීමට තෝරාගනු ඇත.

3.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. යම්කිසි ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 *වැටුප.*– රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුව එම්එන්. 2-2006 අනුව සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ප්‍රාථමික රු. 13,640 - 10x120 - 11 x 140 -6 x 210 - 14 x 290 - 21, 700 වේ.

5.0 මෙම තනතුර ස්ථිර හා දායක විශ්‍රාම වැටුප් සහිතය.

6.0 සුදුසුකම්.– සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ප්‍රාථමික ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය ;
(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 30 ට නොවැඩි විය යුතුය ;
(ඇ) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය ;
(ඈ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය. ;

(i) සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ අංක ගණිතය ද ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් 04කින් සම්මාන සාමාර්ථය සහිතව අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් 06කින් එකවර සමත් වීම ;

හෝ

(ii) පළමුවැනි භාෂාව/ගණිතය ඇතුළු විෂයයන් 04 කට "බී" ශ්‍රේණියට නොඅඩු සාමාර්ථයක් සහිතව ඉංග්‍රීසි භාෂාව ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් 06කින් එකවර ජාතික පොදු සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම ;

සහ

(iii) ඕනෑම විෂයය ධාරාවක් අ. පො. ස. (උසස් පෙළ) විභාගයෙන් විෂයය 03ක් සමත්වීම ;

හෝ

(iv) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම.

සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලුම සුදුසුකම් 2006.08.21 දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

7.0 *තෝරා ගැනීම .–*

(අ) සේවයට බඳවා ගැනීම දිස්ත්‍රික් ජනගහණ අනුපාත පදනම මත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 ට අදාළව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා ඇබෑර්තු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු ඇබෑර්තු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

(i) තෝරා ගැනීම දිස්ත්‍රික්ක මට්ටමින් සිදු කෙරේ.

(අ) *දිස්ත්‍රික්ක මට්ටමට අයත්වීම සඳහා අපේක්ෂකයකුට තිබිය යුතු සුදුසුකම් :*
(01) දිස්ත්‍රික්කය තුළ උපත ලද අයෙකු වීම ;

හෝ

(02) රජය විසින් නියම කරනු ලබන යම් දිනකට පූර්වයෙන් වසර 06ක් එම දිස්ත්‍රික්කයේ පදිංචි හෝ අවුරුදු 03ක වත් අඛණ්ඩ පදිංචිය ඇයට/ඔහුට තිබීම ;

හෝ

(03) නොකඩවා අවුරුදු 05ක් එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතීයික පාසැල් අධ්‍යාපනය ලබා තිබීම.

(ආ) අයදුම්කරුවන් ඉහත (1) යටතේ පදිංචිය සනාථ කිරීම සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න අවුරුදු 03ක ඡන්ද හිමි නාමලේඛන සහ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කිරීමට බැඳී සිටිය යුතුය.

*සටහන.–*

1. යම් අපේක්ෂකයෙකුගේ පියා හෝ මව හෝ රජයේ, පළාත් සභා සේවයේ හෝ සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටියේ නම්, එම අපේක්ෂකයාට තමාගේ, තම පියාගේ හෝ මවගේ හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු ලැබේ. (ඒ සඳහා අයදුම්කරු විසින් තම මවගේ/පියාගේ උප්පැන්න සහතිකයෙහි පිටපතක් ඉදිරිපත් කළ යුතුය.).

2. කිසිම අපේක්ෂකයෙකුට එක් දිස්ත්‍රික්කයකට වැඩි ගණනක ඇබෑර්තු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. තමන් වඩාත් කැමැති දිස්ත්‍රික්කය කවරක් දැයි වරක් සඳහන් කළ පසු එය වෙනස් කළ නොහැකිය.

3. තරග විභාගයේ කුසලතාවය මත තේරී පත් වූ විට පුරප්පාඩු අනුව මධ්‍යම/පළාත් රාජ්‍ය සේවයේ නිරත කරවනු ඇත. ඉල්ලුම් කරන ලද දිස්ත්‍රික්කය කුමක් වුව ද දිවයින පුරා රාජ්‍ය සේවයේ නිරත කරවීම සෞඛ්‍ය කළමනාකරණ සේවා ව්‍යවස්ථාවේ 04: 3 ජේදය ප්‍රකාර වනු ඇත.

4. රජය විසින් කලින්කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ උපදෙස් අදාළ අවස්ථාවලදී භාවිතා කරනු ලැබිය හැකි අතර එවැනි අවස්ථාවලදී විවෘත තරග විභාගයේදී ලකුණු ලබාගන්නා වැඩිම ප්‍රමාණයේ සිට පහළට එමින් පවත්නා පුරප්පාඩු අනුව අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයට ලක් කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලබන අතර අපේක්ෂකයන්ට ලකුණු ලබා දීමක් සිදු නොවේ.

5. දිස්ත්‍රික්කය සඳහා වෙන්වූ ඇබෑර්තු සංඛ්‍යාව අනුව සුදුසුකම් ලැබීමේ විභාගයෙන් වැඩිම ලකුණු ගණනක් ලබා ගත්තා වූ අපේක්ෂකයන් ලකුණු අනුපිළිවෙලට තෝරා ගනු ලැබේ.

8.0 *විභාගයට අදාළ විෂයයයන් කාලය හා ලකුණු :*

| | *විෂයය* | *කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| (i) | භාෂාව හා රචනය (සිංහල/දෙමළ) | පැය 1 | 100 |
| (ii) | අභියෝගතාවය | පැය 1 | 100 |
| (iii) | එකතු කිරීම් ඇතුළුව ගණිතය | පැය 1 | 100 |
| (iv) | සාමාන්‍ය දැනීම | පැය 1 | 100 |
| (v) | ඉංග්‍රීසි භාෂාව | පැය 1 | 100 |
| | | එකතුව | 500 |

1. සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කර බැලීම සඳහා සකස් කර ඇති භාෂාව හා රචනය ප්‍රශ්න පත්‍රයට, ලිපි සකස් කිරීම හා උපලේඛන සකස් කිරීම ආදී කරුණු ඇතුළත්ය.

2. ඉංග්‍රීසි භාෂාව ප්‍රශ්න පත්‍රය, ඡේදයක් තේරුම් ගැනීමට ඇති හැකියාව, රචනා ලිවීම, ලිපි සකස් කිරීම සිංහල/දෙමළ ඡේදයක් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම පිළිබඳව අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයට සමාන ඉංග්‍රීසි දැනුමක් අපේක්ෂා කෙරේ.

9.0 ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. බඳවා ගැනීමෙන් අනතුරුව අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

10.0 *විභාග ගාස්තු.*– ලේකම්, සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය, "සුවසිරිපාය" 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියූ කොළඹ මහ තැපැල් කාර්යාලයෙන් ගෙවිය හැකි මුදල් ඇණවුමක් මගින් රු. 250 ක විභාග ගාස්තුව සෑම අපේක්ෂකයෙකු විසින් ම ගෙවිය යුතුය. මුදල් ඇණවුම අයදුම්පත සමග එවිය යුතුය. විභාග ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

10.1 අයදුම්පත්‍රය ඒ4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්-

(*අ*) අංක 01- 03 දක්වා ඡේදයන් පළමු පිටුවට ද,
(*ආ*) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටු වලට ද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙළ කරගත යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, මුදල් ඇණවුම් අමුණා නොමැති හා අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැණුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත් සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.

11.0 1. අයදුම්පත්‍රය බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ "සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ප්‍රාථමික ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2006" යන්න සහ තරග කරන දිස්ත්‍රික්කය ද සඳහන් කළ යුතු වේ.

2. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 1,24,080 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුප් වර්ධනය රු. 1,560 ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

3. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2006.08.21 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය :

අධ්‍යක්ෂ (පාලන) 06,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
අංක 385,
"සුවසිරිපාය",
කොළඹ 10.

12.0 *විභාගයට පෙනී සිටීම.*– විභාගය පවත්වන දිනට සතියකට කලින් ලැබෙන සේ විභාග ප්‍රවේශ පත්‍ර සෞඛ්‍ය ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. ඒ සම්බන්ධයෙන් නිවේදනයක් පුවත්පත්වල පළවන අතර, ඒ පිළිබඳ අයදුම්කරුවන් අවධානයෙන් සිටිය යුතුය. විභාගයේදී අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. :

(*අ*) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

13.0 ඒ වන විට ප්‍රවේශ පත්‍ර නොලැබුණු අපේක්ෂකයින් පහත සඳහන් විස්තර සහිතව ඒ ගැන අධ්‍යක්ෂ පාලන (06) වෙතින් විමසිය යුතුය. (දුරකථන අංකය : 011-2693339) :
(*අ*) විභාගයේ නම. :—
(*ආ*) තෝරාගත් නගරය. :—
(*ඇ*) ඉල්ලුම් කරන ලද දිස්ත්‍රික්කය.–:—
(*ඈ*) ඉල්ලුම්පත ලියාපදිංචි කිරීමේ අංකය හා තැපැල් කාර්යාලය :—
(*ඉ*) මුදල් ගෙවන ලද රිසිට් පතේ අංකය, දිනය සහ කාර්යාලය. :—

14.0 සියලු අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

රංජිත් මලිගස්පේ,
ලේකම්,
සෞඛ්‍ය, ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය.

2006 ජූනි මස 30 වැනි දින,
සෞඛ්‍ය, ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ දී
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම් පත්‍රය

සෞඛ්‍ය කළමණාකරන සහකාර ප්‍රාථමික ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2006

(දෙන ලද කොටු තුළ නිවැරදි සංකේත/අංකය පැහැදිලිව සටහන් කරන්න)

(කාර්යාලය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින මාධ්‍යය :

සිංහල -S
දෙමළ -T
(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

පුරප්පාඩු සඳහා තරග කිරීමට ගැසට් නිවේදනයයේ 7.0 ඡේදයට අනුකූලව ඔබ තෝරා ගන්නා දිස්ත්‍රික්කය පහතින් සඳහන් කරන්න.

| දිස්ත්‍රික්කය |
|---|
| |

01. (අ) මුලකුරු සමග නම :_______________.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ආ) සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :_______________.

(ඇ) සම්පූර්ණ නම :_______________.
(සිංහලෙන්/දෙමළෙන්)

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

02. *ඉංග්‍රීසියෙන්* *සිංහලෙන්/දෙමළෙන්*

| | | *ඉංග්‍රීසියෙන්* | *සිංහලෙන්/දෙමළෙන්* |
|---|---|---|---|
| (අ) | ස්ථිර ලිපිනය | ...................... | ...................... |
| | | ...................... | ...................... |
| | | ...................... | ...................... |
| | | ...................... | ...................... |
| | | ...................... | ...................... |
| | | ...................... | ...................... |
| | | ...................... | ...................... |

(ඈ) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :_______________.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. (අ) ස්ත්‍රී/පුරුෂ භාවය :—

ස්ත්‍රී : **F** පුරුෂ : M
(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

(ආ) උපන් දිනය: වර්ෂය: [ | | | ] මාසය: [ | ] දිනය : [ | ]

(ඇ) 2006.08.21 දිනට වයස : අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

04. (අ) පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාසය :_______________.
(ආ) එය අයත් උපදිසාපති/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :_______________.
(ඇ) එම දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිටද? :_______________.

05. (අ) අධ්‍යාපන සුදුසුකම් :_______________.
අ. පො. ස (සා. පෙළ) විභාගය :_______________.
විභාගයේ වර්ෂය හා මාසය :_______________.

i. විභාග අංකය :_______________.
ii. ප්‍රතිඵල :_______________.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2. | | 7. | |
| 3 | | 8 | |
| 4. | | 9 | |
| 5. | | 10. | |

(ආ) අ. පො. ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර

(i) විභාගයේ වර්ෂය හා මාසය :__________.
(ii) විභාග අංකය :__________.
(iii) ප්‍රතිඵල :__________.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා ඇත්නම්,
(i) විශ්ව විද්‍යාලය :__________.
(ii) උපාධිය :__________.
(iii) වර්ෂය :__________.

06. වෙනත් සුදුසුකම් :__________.

07. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? :_______________.

ඔව් : [ ] නැත : [ ]

(අදාළ කොටුවේ √ යොදන්න. ඔව් නම් විස්තර සඳහන් කරන්න.) :_______________.

08. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :_______________.
(ii) ලදුපත් අංකය හා දිනය :_______________.
(iii) ගෙවූ මුදල :_______________.

09. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කරමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද, මෙහි සියලුම කොටස් නිවැරදි ව සම්පූර්ණ කර ඇති බවද, ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුදුසුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද, මම දනිමි.

(ඇ) මෙම විභාගයේ කොන්දේසි සියල්ල පිළිපැදීමට එකඟ වෙමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

_______________.
අයදුම්කරුගේ අත්සන

දිනය :_______________.

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................ මයා/මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී .............................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, සහතික කරමි.

_______________.
අත්සන සහතික කරන්නාගේ අත්සන.

දිනය:_______________.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :_______________.
තනතුර :_______________.
ලිපිනය :_______________.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**දිස්ත්‍රික් නාම ලේඛණ හා අංක :**

| | | | |
|---|---|---|---|
| කොළඹ | 01 | ත්‍රිකුණාමලය | 14 |
| ගම්පහ | 02 | මඩකලපුව | 15 |
| කළුතර | 03 | අම්පාර | 16 |
| මාතලේ | 04 | පුත්තලම | 17 |
| මහනුවර | 05 | කුරුණෑගල | 18 |
| නුවරඑළිය | 06 | අනුරාධපුරය | 19 |
| ගාල්ල | 07 | පොළොන්නරුව | 20 |
| මාතර | 08 | බදුල්ල | 21 |
| හම්බන්තොට | 09 | මොණරාගල | 22 |
| යාපනය | 10 | කෑගල්ල | 23 |
| මන්නාරම | 11 | රත්නපුරය | 24 |
| මුලතිව් | 12 | කිලිනොච්චිය | 25 |
| වව්නියාව | 13 | | |

07-405

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.